# 5 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

අතීතයේ සිට අද දක්වා මානව සමාජය විකාශනය ව ඇත්තේ නොනවතින ගැටුම් මධ්‍යයේ ය. එදාට වඩා අද ගැටුම් බහුල ව පවත්නා අතර ඒවා වඩාත් සංකීර්ණ මෙන් ම විනාශකාරී ස්වභාවයක් ද පෙන්නුම් කරයි.

## 5.1 ගැටුම් හැඳින්වීම

මානව සමාජය තුළ විවිධ පුද්ගලයෝ වෙසෙති. ඔවුහු ශරීර හැඩයෙන්, ප්‍රමාණයෙන්. බුද්ධියෙන්, වර්ණයෙන්, සමාජ තරාතිරම්වලින්, කතා කරන භාෂාවෙන් ආදි වශයෙන් විවිධ වෙති. මෙය මානවයා තුළ ස්වභාවයෙන් දැකිය හැකි ලක්ෂණයක් වන අතර ඉන් ඔවුන් අතර විවිධ ආකාරයේ ගැටුම් ඇති කිරීමට ද මග පාදයි. එක ම කරුණක් හෝ සිද්ධියක් පිළිබඳ ව පුද්ගලයෝ විවිධ මත දරති. පහත දැක්වෙන චිත්‍රය දෙස බලන පුද්ගලයින් ඒ පිළිබඳ ව විවිධ අදහස් පළ කළ හැකියි. මෙසේ එක ම දෙයක් පිළිබඳ ව විවිධ අදහස් දැරීමේ පුද්ගල ස්වභාවය නොපිළිගැනීම පුද්ගලයින් අතර ගැටුම්වලට හේතු විය හැකි ය. එසේ පුද්ගලයින් අතර ඇතිවන සුළු ගැටුම් පවා අවසන මහා පරිමාණ ගැටුම් දක්වා වර්ධනය විය හැකි ය.



5.1 චිත්‍රය

**ක්‍රියාකාරකම් 5.1**

1. • ඉහත සඳහන් චිත්‍රය දෙස බලා ඒ පිළිබඳ ඔබගේ අදහස් ලියා දක්වන්න.
   • එකිනෙකා එක ම කරුණක් පිළිබඳ ව දක්වන අදහස් කෙතරම් විවිධාකාර ද යන්න තේරුම් ගන්න.


2. පන්තියේ සිසුන්ට පන්ති කාමරය තුළ තමන් යාමට කැමති ස්ථානයක් කොළ කැබල්ලක සටහන් කිරීමට උපදෙස් දෙන්න. එහි එක් එක් සිසුවාගේ නම ද සටහන් කරවා ගන්න. පසුව ඔවුන් කාණ්ඩවලට බෙදා එක් එක් කාණ්ඩයේ සිසුන්ට කරට අත් දමාගෙන රවුමක් ලෙස සැදී තමන් කැමති ස්ථානයකට යාමට උපදෙස් දෙන්න. ඉන් ඇති වන ගැටුම නිරීක්ෂණය කර කොළ කැබලිවල සඳහන් ස්ථානයට සැමට යා හැකි ආකාරය විසඳා ගැනීමට ඉඩ දෙන්න.

මෙය ඔස්සේ පුද්ගලයා තුළ විවිධ අරමුණු හා අදහස් ඇති බවත් සියලු දෙනාගේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී ව සාමූහික ලෙස සාකච්ඡා කර තීරණවලට එළඹීමේ හැකියාව ඇති බවත් තේරුම් කර දීමට හැකි ය.

**එකිනෙකට පරස්පර අදහස් ඇති පුද්ගලයින් දෙදෙනකු හෝ වැඩි පිරිසක් වාචික ලෙස, කායික ලෙස හෝ ආයුධ මගින් කරගන්නා අරගලය ගැටුමක් වේ.**

විවිධාකාර ගැටුම් නිර්වචනය කරන චින්තකයින් ඒ සම්බන්ධ ව නොයෙකුත් මත පළ කර ඇත. බොහෝ විට ගැටුම් යනු පුද්ගලයාගේ හදවතේ සහ මනසේ ඇති වන ප්‍රකාශනයකි. ගැටුම් ඇතිවන්නේ මනසේ ය. පුද්ගලයා විසින් ඉන්ද්‍රියයන් ඔස්සේ ඇති කර ගනු ලබන ඇලීම මත තම ඇගයීම පාදක ව ගැටීමක් ඇති වන බවත්, යථා තත්ත්වය බුද්ධි විමර්ශනයෙන් තේරුම් ගෙන ඇලීමෙන් මිදුණු තැන ගැටීමක් නැති බවත් දක්වා ඇත. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන පීටර් වොලන්ස්ටීන් "ගැටුමක් යනු දෙපාර්ශ්වයක් අතර හෝ පක්ෂ කීපයක් එක ම අවස්ථාවක දී එක ම හිඟ සම්පත් අත්පත් කර ගැනීමට පෙළඹීම නිසා උද්ගත වන තත්ත්වයකි" යනුවෙන් ප්‍රකාශ කර ඇත. ඔහු මෙහි දී සම්පත් ලෙස අවධාරණය කර ඇත්තේ භූමිය, ස්වභාවික සම්පත්, දේශපාලන බලය, උසස් බව, සාර්ථකත්වය හෝ හරයන්ය. පාසල තුළ දී සිසුන් අතර මකනයට, පැන්සලට, බෝලයට හෝ පුටුවට මෙවැනි ගැටුම් ඇතිවිය හැකි ය. ඒවා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිරාකරණය කර නොගත හොත් මහා පරිමාණ ගැටුම් දක්වා වර්ධනය විය හැකි ය. මන්ද, සහෝදර සහෝදරියන් මෙන් ම අවසානයේ දෙමාපියන් ද සම්බන්ධ වූ විට පාසලින් පිටතට පවා එම ගැටුම් පැතිර යා හැකි බැවිනි.

**ජෝන්-ගැල්ටුංග්ගේ ගැටුම් ත්‍රිකෝණය**




ගැටුමට හේතු :
- නිෂේධනාත්මක ආකල්ප
- හැසිරෙන ආකාරය
- අසමානුපාතික ඉලක්ක

5.2 රූප සටහන

ගැල්ටුංග් දක්වන ආකාරයට මෙහි දැක්වෙන කවර අවස්ථාවක දී වුව ද ගැටුමක් ඇතිවිය හැකි ය.

බොහෝ ආගමික සංකල්ප අනුව, ගැටුමට හෝ සාමයට පාදක වන සියලු ක්‍රියාවන්ට මුල්වන්නේ මිනිසාගේ සිත ය.

**ක්‍රියාකාරකම් 5.2**

පාසල තුළ දී සිසුන් අතර ඇති වන විවිධාකාර ගැටුම් කවරේ ද? එම ගැටුම් ඇති වීමට හේතු වශයෙන් ඔබ දකින්නේ මොනවා ද? වගුවක් ආශ්‍රයෙන් කරුණු දක්වන්න.

### 5.1.1 ගැටුමක අවස්ථා

සමහර විචාරකයින් ගැටුම චක්‍රයක් ලෙස දක ඇත. තවත් අය එය ඉහළ පහළ යන අනුපිළිවෙළක් සහිත ක්‍රියාවලියක් ලෙස දකිති. එහෙත් කිසියම් ගැටුමක අවස්ථා නිශ්චිත ව ගමන් ගන්නා ආරෝහණ ක්‍රියාවලියක් නො වේ. මන්ද, එක් අවස්ථාවක් කිසියම් අවස්ථාවකට පසුව යළි මතු විය හැකි බැවිනි. ගැටුම් අවස්ථා පහත පරිදි සරල බවේ සිට සංකීර්ණ බව දක්වා වර්ධනය විය හැකි ය.

1. **අවිචාරවත් අවස්ථාව** –

   තමන් ඉතා නිවැරදි බව එකිනෙකා සිතීම හා එකිනෙකා පිළිබඳ විචාරවත් හා තුලනාත්මක අවබෝධයක් නොවීම. එකතු වී සංවාද හා සාකච්ඡා මගින් විසඳිය හැකි ය.

2. **බෙදීම් අවස්ථාව** –

   අවිචාරවත් බව පදනම් කර ගෙන කණ්ඩායම් වශයෙන් බෙදී දැඩි ලෙස භේද ඇති කර ගෙන කිසි දා එක්විය නො හැකි යයි සිතීම. දෙපක්ෂය සමගි කරවීම මගින් විසඳිය හැකි ය.

3. **අන්‍යෝන්‍ය දුක්ගැනවිලි ප්‍රකාශ වන අවස්ථාව** –

   මෙහි දී තම තමන්ගේ හැකියා දක්ෂතා, සංඛ්‍යාත්මක ප්‍රමාණ මත වාසි හා අවාසි සහගත තත්ත්වයන් ප්‍රකාශ කරයි. මැදිහත්කරුවකු මගින් වාසි අවාසි සලකා විසඳුම් ඉදිරිපත් කළ හැකි ය. නියෝජනය අඩු පිරිසකට වැඩි නියෝජනයක් සැලසිය හැකි ය.

4. **ධ්‍රැවාන්තකරණ හා සන්නද්ධකරණ අවස්ථාව** –

   මෙම අවස්ථාවේ දී පීඩනයට පත් වූ පිරිස බෙදී කාණ්ඩ ගැසේ. අනතුරු ව එසේ ධ්‍රැවාන්තකරණය වූ පිරිස් සන්නද්ධ වීමට පටන් ගැනේ. එක් වර ම ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් උද්ගත වීමට හේතු නොවුණ ද දුරදිග යාමෙන් ප්‍රචණ්ඩ ගැටුම්කාරී තත්ත්වයකට පත්විය හැකියි.

5. **ප්‍රචණ්ඩ ගැටුම් අවස්ථාව** –


   මෙම අවස්ථාවේ දී එකිනෙකා විනාශ කිරීමෙන් පමණක් තමන්ට පැවතිය හැකි යයි ප්‍රතිපක්ෂ වූ කණ්ඩායම් සිතති. ඒ නිසා සිතාමතා පහර දෙමින් එකිනෙකා පළවා හරිමින් භූගෝලීය ලෙස තම බලය පතුරුවා හැරීමට පෙළඹෙති. කිසිදු ආකාර සාකච්ඡාවකට නොපැමිණ තම ජයග්‍රහණය සටන්කාමී ව ලබා ගැනීමට ක්‍රියා කරති, නැතිනම් ආරක්ෂා වීමට බලති.

**ක්‍රියාකාරකම් 5.3**

(i) පාසල තුළ ඇති වූ ගැටුමක විවිධ අවස්ථා පෙළ ගස්වන්න.
(ii) ගැටුම නිරාකරණය කිරීමට තුබූ එම අවස්ථා මගහැරී යාමට හේතු දක්වන්න.
(iii) ගැටුම වළක්වා ගත නොහැකි වූයේ මන් ද යි විග්‍රහ කරන්න.
(iv) එම ගැටුමට විසඳුම වශයෙන් ඔබ යෝජනා කරන්නේ කවරක් ද යි පැහැදිලි කරන්න.

## 5.2 ගැටුම් වර්ග හා ගැටුම් ඇති වන මූල

ගැටුම් පිළිබඳ අධ්‍යයනය කළ චින්තකයින් කුඩා පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා වූ ගැටුම් විවිධ ස්වරූපවලින් වර්ග කර ඇත.




මෙහි දී මිනිසුන් අතර ඇති වන විවිධ වර්ගයේ ගැටුම් හා ඒවාට බලපාන හේතු කෙටියෙන් දක්වා ඇත. මෙයට අමතර ව වෙනත් දෘෂ්ටිකෝණවලින් ද ගැටුම් වර්ග කරනු දකිය හැකි ය. ඒ අනුව පහත දක්වෙන ගැටුම් වර්ග හඳුනා ගත හැකි ය.

i. **දේශපාලන ගැටුම්** - දේශපාලන මතවාද මුල්කර ගෙන ඇති වන ගැටුම් මේ ගණයට අයත් වේ. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ධනවාදී රටවල් හා සෝවියට් සමූහාණ්ඩු සංගමය ඇතුළු නැගෙනහිර යුරෝපීය සමාජවාදී කඳවුරේ රටවල් අතර අතීතයේ පැවැති ගැටුම්වලට තුඩුදෙන මතභේද හා ඉන්දුනීසියාවේ නැගෙනහිර ටිමෝරය වෙන ම රාජ්‍යයක් බිහි කර ගැනීම සඳහා ගෙන ගිය අරගලය උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.

ii. **ආගමික ගැටුම්** - ඉතිහාසය තුළ සිදු වූ කුරුස යුද්ධවල පටන් අද දක්වා උදාහරණ රැසකි. අයෝධ්‍යාවේ රාම දේවාලයේ මුස්ලිම්වරුන් බබ්රි මස්ජිත් පල්ලිය ඉදි කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවේ මුස්ලිම්වරුන් හා හින්දූන් අතර ගැටුම මීට නිදසුනකි.

iii. **දේශ සීමා ගැටුම්** - රාජ්‍යයන් අතර දේශ සීමා වෙන්කර ගැනීම සම්බන්ධයෙන් ඉතිහාසයේ ගැටුම් ඇති වී තිබේ. ඊශ්‍රායලය හා පලස්තීනය අතර දෙ රටේ දේශ සීමා වෙන්කර ගැනීම සම්බන්ධයෙන් වන ගැටුම් මීට උදාහරණයක් වශයෙන් දැක්විය හැකි ය.

iv. වර්ණභේදවාදී ගැටුම් - සුදු ජාතිකයින් හා කළු ජාතිකයින් අතර ඇති වන ගැටුම් ගැන අපි අසා ඇත්තෙමු. දකුණු අප්‍රිකාව තුළ පවතින ගැටුම් මීන් විශේෂ වන අතර එවැනි ගැටුම් ඇමෙරිකාවේ ද වරින් වර ඉස්මතු වෙමින් පවතී.

v. ආර්ථික සම්පත් සම්බන්ධයෙන් වන ගැටුම් - තෙල් සම්පත සම්බන්ධයෙන් ඇති වන ගැටුම් මෙහි දී විශේෂයෙන් පෙන්විය හැකි ය. ඉරාකය හා ඇමෙරිකාව අතර ඇති ව පවත්නා ගැටුම් තෙල් සම්පත මුල් කරගත් ඒවා ය.

vi. ගෝත්‍රික හෝ කුල ගැටුම් - මීට උදාහරණ වශයෙන් අප්‍රිකානු රටවල පවත්නා ගෝත්‍රික ගැටුම්, රුවණ්ඩාවේ ටුට්සිවරුන් හා හුටු ගෝත්‍ර අතර ගැටුම් උතුරු හා බටහිර කඳුකර ගෝත්‍රික ජනයා සම්බන්ධ තායිලන්ත ක්‍රියාවන් ද, ඉන්දියාවේ හින්දූන් හා හරිජනයා අතර ඇති වන ගැටුම් ද පෙන්විය හැකි ය.

**ක්‍රියාකාරකම් 5.4**

ඔබ හඳුනාගත් ගැටුම් වර්ග අනුව මේ වගුව සම්පූර්ණ කරන්න.

| ගැටුම් වර්ගය | උදාහරණ | බලපා ඇති හේතු |
|---|---|---|
| | | |

ගැටුම් ඇතිවීමට බලපාන හේතු පිරික්සන විට

- පුද්ගලයාගේ නූගත්කම
- යහපත් සමාජානුයෝජනයක් නොවීම
- බුද්ධිහීන බව
- ජීව විද්‍යාත්මක උරුමයක් වන ආක්‍රමණශීලි බව
- ආත්මාර්ථකාමී වීම
- හැඟීම්බර ව වෙනත් විකල්ප නොසොයා තීරණ ගැනීම

වැනි හේතු සාධක පුද්ගල මට්ටමේ කුඩා ගැටුමක සිට මහා පරිමාණ ලෝක යුද්ධ දක්වා වූ ගැටුම් ඇතිවීමට බලපාන බැව් පෙනේ.

**ක්‍රියාකාරකම් 5.5**

- ගැටුම් ඇතිවීමට බලපාන හේතු විස්තර කරන්න.
- "ගැටුම්වල මූලය ජීව විද්‍යාත්මක උරුමය වන ආක්‍රමණශීලී බවයි." යන තේමාව යටතේ ඊට පක්ෂව හා විපක්ෂ ව පන්තියේ විවාදයක් පැවැත්වීමට සැලසුම් කරන්න.

### 5.2.1 රටක සංවර්ධනයට ගැටුම්වලින් වන හානිය

එදා සිට අද දක්වා මිනිසා විසින් නිර්මාණය කරන ලද ගැටුම්වලින් සිදු ව ඇති විනාශය අති මහත් ය. නවීන විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවක් සමඟ ගැටුම්වල විනාශකාරී බව එදාට වඩා අද විශාල ලෙස වැඩි වී ඇත. පොදුවේ සලකා බලන විට මෙම හානිය පහත දැක්වෙන අයුරින් පෙන්වා දිය හැකි ය.

- ජීවිත හා දේපොළ විනාශය
- පරිසරය හා ස්වාභාවික සම්පත් විනාශය
- ශාරීරික ආබාධිතයන් ඇති වීම. මානසික ආබාධවලට ගොදුරු වීම, පවුල් අවුල් වැඩි වීම, සරණාගත කඳවුරු බිහිවීම හා පොදුවේ සමස්ත සමාජ ක්‍රමය ම අවුල් වීම
- රටේ ආර්ථිකය හා ජීවන මාර්ග බිඳ වැටීම නිසා වන ආර්ථික ගැටලු
- විශාල හමුදාවක නඩත්තුව හා නවීන යුද ආයුධ මිලදී ගැනීම සඳහා වන ආරක්ෂක වියදම් වැඩිවීමෙන් සංවර්ධනය ඇන හිටීම
- තරුණ පරපුරේ අධ්‍යාපනය බිඳ වැටීමත් සමග මානව සදාචාරය පිරිහීමෙන් වන සමාජ ගැටුම් වර්ධනය
- භෞතික විනාශයන් නැවත ගොඩනැගීමට විශාල මුදලක් වැය කිරීමෙන් සංවර්ධනයට වන හානිය
- මිත්‍රත්වය හා සබඳතා බිඳ වැටී අවිශ්වාසය හා වෛරය වර්ධනය වීම
- ජාත්‍යන්තර සබඳතා බිඳ වැටීම හා ආයෝජකයින් රට හැර යාම

**ක්‍රියාකාරකම් 5.6**

- ඔබ වඩාත් කම්පනයට පත් කළ ගැටුම්කාරී අවස්ථාවක් ගුරුතුමාගේ/තුමියගේ උපදෙස් මත තෝරා ගෙන ඉන් සිදු වූ විනාශය සාකච්ඡා කරන්න.
- එම ගැටුම්කාරී අවස්ථාව ඇති වීමට තුඩු දුන් හේතු විග්‍රහ කරන්න.

  එම අවස්ථාව ඇති නොවන ආකාරයට කටයුතු කළ හැකි ව තිබුණේ ද යන්න සාකච්ඡා කරන්න.

## 5.3 ගැටුම් නිරාකරණය කිරීමේ විධික්‍රම

පුද්ගලයින් සාහසික ක්‍රියාවලට පෙළඹෙන්නේ විවිධ සමාජ සම්බන්ධතාවල දී ඇති වන මතභේද හා ගැටලු විසඳා ගැනීමට නොහැකි වී සිදුවන ඉච්ඡාභංගත්වය නිසා ය. ශිෂ්ට සම්පන්න ලෙසට ගැටුම් විසඳා ගැනීමට නොහැකි වන කල්හි ඔවුහු ප්‍රාථමික මානසික තත්ත්වයට වැටී ඒවා විසඳා ගැනීමට ක්‍රියා කරති. ගැටුමට පෙළඹීමේ, මානවයා තුළ ඇති සහජ ලක්ෂණය ඉවත් කළ හැක්කේ ඔහුට ලබා දෙන අධ්‍යාපනය තුළින්, ගැටුම් විසඳා ගැනීමට අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමෙනි.

ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයා තුළ මූලික කුසලතා හතරක් තිබිය යුතු ය. එවන් කුසලතාවන්ගෙන් තොර ව ගැටුම් නිරාකරණයට පිවිසීම යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට බාධාවකි. එම කුසලතා නම්,

1. ගැටුම් විශ්ලේෂණය - ගැටුම් ස්වාභාවික බවත්, ඒවාට බලපාන හේතු පුද්ගල අවශ්‍යතා, භීතීන්, හේතුඵල ආදි ලෙස විමර්ශනය කිරීම.
2. විකල්ප ජනනය - තම මතය පමණක් නො ව වෙනත් විසඳුම් ද පවතින බව පිළිගැනීම.
3. සහමන්ත්‍රණය - ගැටුමට අදාළ පාර්ශ්ව සමග සහයෝගයෙන් අදහස් හුවමාරුකර ගැනීමේ හැකියාව.
4. සමථකරණය - මැදිහත් ලෙස අවසන් විසඳුමකට එළඹුම සඳහා උපකාරී වීම.

> *"ගැටුම් නිරාකරණය යනු ගැටුම් පාර්ශ්ව අතර නමය සහ අවසාන සම්බන්ධතා ගොඩ නැගීම වේ."*
>
> ◆ *සයිමන් ෆිෂර් ඇතුළු කණ්ඩායම*

දැනට සිදුවෙමින් පවතින ගැටුමක හෝ ඉදිරියේ ඇති වීමට ඉඩ කඩ ඇති ගැටුමක පූර්ණ සංඥා හඳුනා ගනිමින් ඒවා ඇති වීම වැළැක්වීමට ක්‍රියා කිරීම ගැටුම් නිරාකරණයයි. ගැටුම් නිරාකරණය යැයි කී විට එහි අන්තර්ගත විය යුතු කරුණු කීපයකි.

- ගැටුමට සම්බන්ධ පදනම් සාධක මුලින් උපුටා දැමීමට ක්‍රියා කිරීම.
- ගැටුමට පත්ව ඇති පාර්ශ්ව අතර නව සම්බන්ධතා ගොඩ නැගීමට කටයුතු කිරීම.
- ඔවුන් තුළ ධනාත්මක ආකල්ප ජනිත කිරීම.
- ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමට ඇති ඉඩ ප්‍රස්තා වළකා ලීම.

අතීතයේ සිට ගැටුම් නිරාකරණයේ දී විවිධ ක්‍රම භාවිත කර ඇත. එහි දී අනුගමනය කළ එක් ක්‍රමයක් වූයේ ගැටුමට පාත්‍ර වූ පුද්ගලයන් වෙත විසඳුම් බලයෙන් පැටවීමයි. නමුත් විසඳුම් බලයෙන් පැටවූ පමණින් එය සැබෑ ගැටුම් නිරාකරණයක් වන්නේ නැත. ගැටුම් නිරාකරණය වන්නේ නිර්මාණාත්මක ව සහ අවිහිංසාවාදී ව ප්‍රශ්න විසඳමින් ගැටුමට සම්බන්ධ සියලු පාර්ශ්වවල අනන්‍යතාව පිළිබඳ ඇගයුම් හඳුනා ගනිමින්, ඔවුන්ගේ මානව අවශ්‍යතා සහ


ආසාවන්ට අවශ්‍ය පිළියම් යෙදීමෙනි. ගැටුම්වලින් මගහැර යාම ද සැබෑ ගැටුම් විසඳීමක් වන්නේ නැත. මන්ද ඉන් ගැටුමට හේතු වූ මූලයන් නැවත ඉස්මතු වන හෙයිනි. ගැටුම් විසඳීමේ දී යොදාගත හැකි සාර්ථක ම ක්‍රමය නම් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඊට මුහුණ දීමයි. ඉන් පාර්ශ්වකරුවන්ට සුහද ව පිළිගත හැකි විසඳුමක් කරා එළඹීමට ඉඩ සැලසේ.

ගැටුමට හේතුව මුලින් අනාවරණය කර ගත යුතු ය. දෙපාර්ශ්වය ම එහි යථා ස්වභාවය තේරුම් ගෙන, එම හේතුව සමනය කිරීමෙන් ගැටුම නිරාකරණය කරගත හැකි ය. එහි දී දෙපාර්ශ්වය ම එය තමා පිළිබඳ මානක කොට අවබෝධ කර ගත යුතු ය.

**ක්‍රියාකාරකම් 5.7**

- ගැටුම් නිරාකරණය අර්ථ දක්වන්න.
- ගැටුම් නිරාකරණයේ දී පුද්ගලයකු තුළ තිබිය යුතු මූලික ගුණාංග හඳුන්වන්න.

### 5.3.1 ගැටුම් විසඳීමේ ප්‍රවේශය




පුද්ගලයින් අතර ඇති වන කුඩා ගැටුමක සිට මහා පරිමාණ ලෝක ගැටුම් දක්වා ගැටුම්වලට විසඳුම් සොයන මාර්ගය මෙයින් පෙන්නුම් කරයි. මෙහි දී ගැටුමට පාත්‍ර ව සිටින සියලු පාර්ශ්ව සාකච්ඡා මගින් ප්‍රශ්නය විසඳා ගැනීමට කැමැත්ත දක්විය යුතුයි.

එහි දී සියලු පාර්ශ්ව

- අන්‍යයන්ගේ අදහස්වලට ඉවසීමෙන් යුතු ව සවන් දීමට
- ඔවුන්ගේ මත, අදහස් හා හරයන් උකහා ගැනීමට
- තම මතයේ පමණක් එල්බ නොසිට ස්ථාවරයන් වෙනස් කර ගැනීමට
- සහයෝගයෙන් යුතු ව පොදු නව මතයක් උත්පාදනය කර ගැනීමට

හැකියාව ඇති සංවේදී මනසකින් යුතු පිරිසක් විය යුතුයි. මෙම ගැටුම් විසඳීමේ ක්‍රියාවලිය පහත දක්වෙන සටහන මගින් තවදුරටත් පැහැදිලි කරගත හැකි ය.




මෙහි දී ගැටුමට පාත්‍ර ව සිටිනුයේ x හා y කණ්ඩායම් දෙක ය. පළමුව කණ්ඩායම් දෙක ම ගැටුම සම්බන්ධ අදහස් සුහද ව, විවෘත ව, හුවමාරු කරගත යුතු ය. දෙවන අදියරේ දී ගැටුමට බලපා ඇති හේතු සාධක හඳුනා ගත යුතුයි. දෙපිරිස ඉදිරිපත් කරන හේතු සාධක තම මතයේ ම එල්බ නොසිට නම්‍යශීලී ව විමසිය යුතුයි. ඉන් විකල්ප නව අදහස් උත්පාදනය වේ. ඒ මෙහි දී දෙපිරිස ම අවශ්‍ය කැප කිරීම් කිරීමට නම්‍යශීලී වන නිසාවෙනි. අනතුරුව දෙපිරිස ම විකල්ප නව අදහස් පිළිගැනීම තුළින් විසඳුමකට ඒමට ඉඩ සැලසේ. මෙහි දී සමථකරුවකුගේ මැදිහත් වීමක් සිදු වී නැත.

ජීවිත හා දේපළ විශාල ලෙස විනාශ වූ දිගු කලක් පැවති ගැටුමක් මැදිහත්කරුවකුගෙන් තොර ව විසඳීම අපහසු ය.

ගැටුම් කළමනාකරණය ගැටුම් නිරාකරණයට වඩා වෙනස් වන ක්‍රියාකාරීත්වයකි. ඇත්ත වශයෙන් ම ගැටුම් නිරාකරණය යනු සාමූහික එකඟත්වයක් තුළින් ඊට සම්බන්ධ පාර්ශ්වයන්ගේ ආසාවන් සහ අවශ්‍යතාවන් සංතෘප්ත කර ගැනීමකි. එය කිසිදු විටෙක කිසියම් පාර්ශ්වයක් වෙත විසඳුම් බලයෙන් පැටවීමක් නො වේ. ගැටුම් කළමනාකරණය යනු ගැටුමකට දිගුකාලීන විසඳුමක් ලබා දීම නො වේ. ගැටුමට සම්බන්ධ පාර්ශ්වවල ආසාවන් හා අපේක්ෂාවන් ධනාත්මක ව හැසිරවීමයි. මෙහි දී සාමූහික ක්‍රියාදාමයක් මගින් ගැටුමට අදාළ පාර්ශ්ව එකතු කිරීමට කටයුතු කරනු ලබයි.

ගැටුම් නිරාකරණය ඉතාමත් දුෂ්කර හා සංකීර්ණ ක්‍රියාවලියකි. ලෝකයේ ඇතැම් ගැටුම් නිරාකරණ ක්‍රියාවලි අසාර්ථක වී ඉන් පසුව ඒවා පැවති තත්ත්වයට ද වඩා තීව්‍ර වී මහත් විනාශයන් ගෙන දී තිබෙනු දැකිය හැකි ය.

මෙරට පැවති ජනවාර්ගික ගැටලුවෙන් ද ජීවිත හා දේපළ විශාල ලෙස විනාශ විය. රටේ සංවර්ධනයට හා ජන ජීවිතයට ඉන් මහත් හානි සිදු විය.

මෙවැනි ගැටුමක් විසඳීමේ දී මැදිහත්කරුවකු තුළ පැවතිය යුතු ගුණාංග පහත දක්වෙන අයුරින් පෙන්වා දිය හැකි ය.

- ඉවසිලිමත් ව ඇහුම්කන් දෙන්නකු වීම.
- විශ්වාසවන්තයකු වීම.
- සමථකරණයට ඇප කැප වූවකු වීම.
- අවංක චේතනාවෙන් සමථකරණයට මැදිහත් වූවකු වීම.
- සමථකරණ පිළිබඳ පළපුරුදු අයකු වීම.
- ගැටලු විසඳීමට උපකාරී වන්නකු වීම.
- මධ්‍යස්ථ හා අපක්ෂපාතී භාවය.

සමථකරුවකු නැතිනම් මැදිහත්කරුවකු කිසි විටෙකත් තීන්දු දෙන විනිසුරුවකු හෝ බලධාරියකු නො වන්නේ ය. ඔහු තර්කානුකූල ව කරුණු තේරුම් ගත හැකි හා තේරුම් කර දිය හැකි කෙනෙකු වන අතර ගැටලු විසඳීමට උපකාර කරන්නෙකි.

**ක්‍රියාකාරකම් 5.8**

- පන්තියේ ඇති වූ ගැටුමක් ගුරුවරයා විසින් සමථකරුවකු හා සිසුන් කණ්ඩායම් දෙකක් යොදා විසඳන ආකාරය නිරූපණය කරන්න.

## 5.4 ගැටුම් මගහැරීමේ හා සාමකාමී ව විසඳීමේ වාසි

මිනිසා ස්වභාවයෙන් ම ආක්‍රමණශීලි ය යන මතය ජීව විද්‍යාත්මක සාධක මත ගොඩ නැගී ඇත. ඒ අනුව ගැටුමකින් උපායශීලී ව මග හැර යාම ද මානව චර්යා වර්ධනයේ උසස් ගුණාංගයකි. මන්ද, එයින් සිදු විය හැකි මහත් හානියක් තාවකාලික ලෙස වළක්වා ගත හැකි හෙයිනි. එසේ ම ඉන් සැබෑ ගැටුම් නිරාකරණයකට මග පාදා ගැනීමට ද ඉඩ ප්‍රස්තාව සැලසේ. කෙසේ වුවත් ගැටුම්වලින් උපක්‍රමශීලී ව මගහැර යාමෙන් ගැටුමට බලපාන හේතු සාධක සම්පූර්ණයෙන් ම මුලිනුපුටා දැමීමට හැකි වන්නේ නැත. ඒ නිසා අප යොමු විය යුත්තේ සැබෑ ගැටුම් නිරාකරණ ක්‍රියාදාමයක් වෙත ය. ඉන් මානව සමාජයට වාසි රැසක් ලබා ගත හැකි ය.

සාර්ථක ගැටුම් නිරාකරණයට හොඳම උදාහරණය දකුණු අප්‍රිකාවයි. පලස්තීනය ගැටුම විසඳීමට ප්‍රවේශ වුවත් මෙතෙක් සාර්ථක නොවූ රටකි.

**ගැටුම් නිරාකරණයේ වාසි**

- සතුරු ව සිටි කණ්ඩායම් අතර ඇති වන සබැඳියාව හා සහයෝගය තුළින් නව ජීවයක් ලැබ මානව සම්පත් සංවර්ධනය හා ජාතික අනන්‍යතාව තහවුරු වීම.
- ගැටුම තුළින් නිර්මාණය කර තිබූ අස්ථාවර බව පහ ව යාමෙන් පොදුවේ ජනතාව තුළ ඇති වන උද්‍යෝගය හා උනන්දුව රටේ සංවර්ධනයට දායක වීම.
- මෙතෙක් සිදු වූ ජීවිත හා දේපළ හානිය වැළැකීම.
- යුද්ධායුධ සඳහා වැය වන විශාල මුදල් ප්‍රමාණය රටේ සංවර්ධනයට යොමු කළ හැකි වීම.
- දෙපාර්ශ්වයේ ම ආරක්ෂක හමුදාවල ප්‍රමාණය අඩු කර ඔවුන් රටේ සංවර්ධන කාර්ය සඳහා යොමු කළ හැකි වීම.
- ගැටුම් නිසා රටේ ස්වභාවික පරිසරයට හා වායු ගෝලයට සිදු වූ හානිය නැවතීම.
- පුනරුත්ථාපන කටයුතු නවතා ජනතාවට ස්ථාවර පදිංචි ස්ථාන ලබා දිය හැකි වීම. රජයට වියදම් අඩුකර ගැනීමට මෙන් ම ජනතාව නිෂ්පාදන කාර්යයේ යෙදවීමට හැකි වීම.
- ජාත්‍යන්තර සබඳතා වර්ධනය හා ආයෝජකයින් පැමිණීම වර්ධනය වීම.
- බිඳ වැටී ඇති අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර මානව සංවර්ධනයට හා රටේ දියුණුවට අධ්‍යාපනය දායක කරගත හැකි වීම.

පොදුවේ බලන විට සාමකාමී සමාජයක් තුළ රට සංවර්ධනය වී, ජනතාවට අවශ්‍ය රැකියා උත්පාදනය වී, නිෂ්පාදනය ඉහළ ගොස්, ජනතාවට සුබදායි පරිසරයක් ගොඩ නැඟෙනු ඇත. එය රටක සාමකාමී පරිසරයක් ගොඩනැගීමට දායක වේ.

**ක්‍රියාකාරකම් 5.9**

1. ගැටුම් නිරාකරණයෙන් රටකට ලැබෙන වාසි පිළිබඳ ව සටහනක් සකස් කරන්න. ගැටුම් ඇති වූ රටවලින්, උදාහරණ ඉදිරිපත් කරන්න.
2. පාසලේ, පවුලේ හෝ ගමේ ඇති වූ ගැටුමක මැදිහත්කරු ලෙස කටයුතු කිරීමට ඔබට සිදු වූයේ යයි සිතන්න.

   ඔබ මෙහි දී ක්‍රියා කරන ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න.
3. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය කිරීමේ දී පාලක පක්ෂය විසින් ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරන්න.
   - ඔබේ අදහස් පන්තියට ඉදිරිපත් කරන්න.
   - ඔබේ අදහස් හා පන්තියේ සෙසු අයගේ අදහස් අතර සමාන අසමාන තැන් සාකච්ඡා කර වඩාත් සුදුසු ක්‍රමවේදයන් පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.